මගේ අංකය
எனது இல.
My No. RG/NB/01/04

ඔබේ අංකය
உமது இல.
Your No.

දුරකථන අංක
தொலைபேசி இல.
Telephone Nos 2889488
2889489

ෆැක්ස් අංක
தொலைநகல்
Fax No 2889491
2889492

ඊ-මේල්
மின்னஞ்சல்
E-mail rgd@sltnet.lk

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**
பதிவாளர் நாயகம் திணைக்களம்
REGISTRAR GENERAL'S DEPARTMENT

**ප්‍රධාන කාර්යාලය**
தலைமை அலுவலகம்
HEAD OFFICE

තැ.පෙ.අංකය
த.பெ.இல.
P.O.Box No.

22

234/ඒ3
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත
බත්තරමුල්ල.
234/ஏ3 டென்சில் கொப்பேகடுவ
மாவத்தை, பத்தரமுல்ல
234/A3
Densil kobbakaduwa Mawatha
Battaramulla

වෙබ් අඩවිය
இணைய தளம்
Web Site www.rgd.gov.lk

දිනය/திகதி/Date 2013.01.16

චක්‍රලේඛ අංක: 3/2013

සියලුම ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් වෙත

## 2013 අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම
## ලේඛණ ලියා පදිංචි කිරීම, සහතික පිටපත් නිකුත් කිරීම සහ සෙවීම සඳහා ගාස්තු අයකිරීම

උක්ත කරුණ සම්බන්ධයෙන් මගේ සමාංක සහ 2013.01.09 දින දරණ චක්‍රලේඛ මිපියට අමතර වශයෙනි.

02. එකී චක්‍රලේඛයේ දී ඇති උපදෙස් වලට ඔබගේ අවධානය යොමුකරවන අතර, ඉඩම් ලේඛණ පරීක්ෂා කිරීමට අදාළව සුචි පරීක්ෂා කිරීමට අවශ්‍ය වන්නේ නම් එකී සුචි පරීක්ෂා කිරීමට ඉඩදිය යුතු අතර ඒ සඳහා අමතර ගාස්තු අයනොකිරීමට අදාළ නිළධාරීන් දැනුවත් කරන්න. එසේම හිමිකම් වාර්තා සකස් කිරීමට අදාළව මුල් ඉඩමින් බෙදී ගිය අනෙකුත් ඉඩම් කොටස් පරීක්ෂා කිරීමට ලේඛණ ඉල්ලා සිටියහොත් අමතර ගාස්තු අයකිරීමකින් තොරව එකී ලේඛණ පරීක්ෂා කිරීමට ඉඩදීමට බාධාවක් නොවන බව වැඩි දුරටත් දන්වමි.

ඊ.එම්.ගුණසේකර
රෙජිස්ට්‍රාර් ජනරාල්.

පිටපත්: 1. ලේකම්, රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය - දැනගැනීම සඳහා.
2. ප්‍රධාන කාර්යාලයේ සියලුම මාණ්ඩලික නිළධාරීන් වෙත - දැනගැනීම සඳහා.
3. ප්‍රධාන ගණකාධිකාරී - දැනගැනීම සඳහා.
4. සියලුම කලාපභාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් වරුන් වෙත - දැනගැනීම සහ අවශ්‍ය කටයුතු සඳහා.
5. ගණකාධිකාරී - අභ්‍යන්තර විගණන අංශය - දැනගැනීම සහ අවශ්‍ය කටයුතු සඳහා.

ඊ. එම්. ගුණසේකර
රෙජිස්ට්‍රාර් ජනරාල්

අදාළ ඉඩම් කොටස ලියා පදිංචි වී ඇති පත් ඉරුවෙන් ඉදිරියට ගෙනගිය ලේඛණ සහ අදාළ ඉඩම් කොටස ලියා පදිංචි වී ඇති පත්ඉරුවෙන් පසු පසට ගිය සියලු මුල් ලේඛණද, ඒකාබද්ධව සැදුණු පත්ඉරුද සමග සෙවීම සඳහා ලබාදිය යුතුය. ඉඩම් කොටසට අදාළ මාරග අයිතීන් ලියා පදිංචිවී ඇති පත් ඉරු සෙවීම සඳහාද අදාළ ලේඛණ ලබාදිය යුතුය. එහෙත් ඒකාබද්ධ ඉඩමින් හෝ මුල් ඉඩමින් බෙදීගිය අනෙකුත් ඉඩම් කොටස් වලට අදාළ ලේඛණ ලබා නොදීමට අවශ්‍ය කටයුතු කළ යුතු අතර මුල් ඉඩම් කොටසින් බෙදී ගිය වෙනත් ඉඩම් කොටසකට අදාළ ලේඛණද පරීක්ෂා කිරීමට අවශ්‍ය නම් ඒ සඳහා වෙනම පරීක්ෂා කිරීමේ ගාස්තු අයකළ යුතුය.

II. එක් ඉඩමකට අදාළව පත්ඉරු නිකුත් කිරීමේදීද, ඉහත I යටතේ සඳහන් කර ඇති පරිදි පත් ඉරු නිකුත් වන බවට වග බලාගත යුතුය.

III. සෙවීම් සඳහා ඉල්ලුම් පත්‍ර භාරගැනීමේ දී දිරාපත් ඉඩම් ලේඛණ පරීක්ෂා කිරීම සඳහා ගාස්තු අයකිරීමට පෙර අදාළ ඉඩම් ලේඛණ තම කාර්යාලයේ දිරාපත් වී නොමැති බවට තහවුරු කරගැනීමෙන් පසුව ගාස්තු අයකිරීමට කටයුතු කිරීම තුළින් පැන නැගිය හැකි ගැටලු අවම කරගත හැකිවනු ඇත. මේ සඳහා දිරාපත් ඉඩම් ලේඛණ ලැයිස්තුව යාවත්කාලීනව පවත්වාගෙන යෑමට ක්‍රියා කළ යුතුය

IV. දෙවන පිටපත් පරීක්ෂා කිරීම සඳහා ඉල්ලුම් පත්‍ර භාරගැනීමේ දී තම කාර්යාලයේ ඇති දෙවන පිටපත් සඳහා පමණක් ඉල්ලුම් පත්‍ර සඳහා පමණක් ගාස්තු අයකිරීමට ක්‍රියා කළ යුතු අතර, තම කාර්යාලයේ නොමැති දෙවන පිටපත් පරීක්ෂා කිරීම සඳහා ඉල්ලුම් පත්‍ර භාරගෙන ගාස්තු අය කිරීමෙන් පාර්ශවකරුවන් අපහසුතාවයට පත්විය හැකි බැවින් ඉල්ලුම්පත්‍ර භාර ගැනීමේදී වඩාත් සැළකිලිමත්ව ක්‍රියාකළ යුතුය. මේ සඳහා තම කාර්යාලයේ ඇති දෙවන පිටපත් ලේඛණය යාවත්කාලීනව පවත්වාගෙන යා යුතුය.

V. දෙවන පිටපත් පරීක්ෂා කිරීමේදී අදාළ ඔප්පුවේ සඳහන් ව ඇති අනෙකුත් නොතාරිස්වරුන්ගේ දෙවන පිටපත් පරීක්ෂා කිරීමට ඉල්ලා සිටියහොත් නැවත ගාස්තු අය කිරීමකින් තොරව පරීක්ෂා කිරීම සඳහා ඉඩ ලබාදිය යුතුය.

VI. ඉඩම් ලේඛණ හෝ දෙවන පිටපත් පරීක්ෂා කිරීමට කිසියම් හේතුවක් මත කිසියම් පාර්ශවකරුවකුට එදිනම නොහැකි වුවහොත් වෙනත් දිනයක එකී ලේඛණ පරීක්ෂා කිරීමට ඉඩදිය යුතු අතර ඒ පිළිබඳ ඔබගේ නියෝගයක් අදාළ ඉල්ලුම් පත්‍රයේ සඳහන් කිරීමට පියවර ගන්න.

ආර්.එම්.ගුණසේකර
රෙජිස්ට්‍රාර් ජනරාල්

| | | |
|---|---|---|
| 1. | ලේකම්, රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | - දැනගැනීම සඳහා |
| 2. | ප්‍රධාන කාර්යාලයේ සියලුම මාණ්ඩලික නිළධාරීන් වෙත | - දැනගැනීම සඳහා |
| 3. | ප්‍රධාන ගණකාධිකාරී | - දැනගැනීම සහ අවශ්‍ය කටයුතු සඳහා |
| 4. | සියලුම කලාපභාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් වරුන් වෙත | - දැනගැනීම සහ අවශ්‍ය කටයුතු සඳහා |
| 5. | ගණකාධිකාරී- අභ්‍යන්තර විගණන අංශය | - දැනගැනීම සහ අවශ්‍ය කටයුතු සඳහා |

... ගුණසේකර
... ජනරාල්